# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நீதியானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**


2015.10.13

ගරු අමාත්‍ය ෆයිසර් මුස්තාපා මැතිතුමා,

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,

නො. 330, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත,

යූනියන් පෙදෙස,

කොළඹ 02.

ගරු අමාත්‍ය තුමනි,

**පළාත් පාලන මැතිවරණය කඩිනමින් පැවැත්වීම**

ශ්‍රී ලංකාවේ ජනතාවට ඉතාම සමීප මහජන නියෝජිත ආයතන මෙන්ම ජනතාවගේ එදිනෙදා කටයුතුවලදී අත්‍යවශ්‍ය ආයතන වනුයේ පළාත් පාලන ආයතනයන්ය. දැනටමත් සමහර ප්‍රදේශවල මඩකලපුව, යාපනය, වව්නියාව වසර දෙකකට ආසන්න කාලයක්, නිලධාරීන්ගේ පාලනය යටතේ ක්‍රියාත්මක වේ. දකුණේ ද අති බහුතර ප්‍රමාණයක් 2015 මැයි සිට නිලධාරීන් යටතේ ක්‍රියාත්මක වේ. එබැවින් පළාත් පාලන මැතිවරණ කඩිනමින් පැවැත්වීම කෙරෙහි අවධානය යොමුකළ යුතුව ඇත.

පළාත් පාලන මැතිවරණය මාර්තු මාසයේ පැවැත්වීම පිළිබඳ විවිධ අදහස් මේ වන විට පළවෙමින් තිබේ. එහෙත් යෝජිත ක්‍රමයට මැතිවරණ පැවැත්වීමට නම්, සීමා නිර්ණය කිරීම් පිළිබඳව සහ විශේෂයෙන්ම පනතේ පවතින තාක්ෂණික ගැටළු නිරාකරණය කර ගැනීමට යම් කාලයක් ගතවනු ඇත. එබැවින් ඒ සඳහා මැතිවරණ කොමසාරිස් වරයා ඇතුලු අනෙකුත් පාර්ශ්ව සමග කඩිනම් සංවාදයක් හා නිසි වැඩපිළිවෙලක් සකසන ලෙස කාරුණිකව ඉල්ලමි.

එමෙන්ම නව ක්‍රමයට මැතිවරණය පවත්වන්නේ නම් ජන්ද දායකයන් ඒ පිළිබඳව දැනුවත් කිරීම ද අවශ්‍යතාවයක්ව පවතී.

එබැවින් මේ පිළිබඳව ඔබ තුමාගේ කඩිනම් අවධානය යොමු වනු ඇතැයි විශ්වාස කරන අතර ඔබ තුමා ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව අපව දැනුවත් කරන්නේ නම් බෙහෙවින් කෘතඥ වෙමි.

ස්තුතියි.

මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි,

විධායක අධ්‍යක්ෂ.

පිටපත - විෂයභාර නියෝජ්‍ය අමාත්‍ය තුමා

මැතිවරණ කොමසාරිස් තුමා.


# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel : (+94) 11 2514441 / 11 2514442 Fax : (+94) 11 2514443
E-mail : paffrel@sltnet.lk Website : www.paffrel.lk